**ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය - 2016**

---------------------------------------------------------------

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂපත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනතේ 50(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වල දී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර , මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් ඊට කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා දිගුකාලීන බදු පදනම මත රු.45,856,451 ක් (රු.4,856,451 ක බදු ද ඇතුලත් ) වැය කර 2015 වර්ෂයේදී ඉඩමක් මිලදී ගෙන තිබු අතර ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) මෙම ඉඩම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි බදු දේපලක් ලෙස වෙනම දක්වා නොතිබුණු අතර 2016 දෙසැම්බර් 31 දින දක්වා ඉඩමෙහි වටිනාකම ක්‍රමක්ෂය කිරීමටද කටයුතු කර නොතිබුණි.

(ii) ඉඩම බදු ගැනීම වෙනුවෙන් බලශක්ති අරමුදලින් ලබාගත් රු.47,000,000 ක මුදල ප්‍රාග්ධන ලැබීම් ලෙස නොව අයභාර ලැබීමක් ලෙස හඳුනාගෙන 2015 වර්ෂයේ මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශනයෙහි වෙනත් ආදායම් යටතේ ගිණුම් ගතකර තිබුණි. මේ හේතුවෙන් එම වර්ෂයේ අතිරික්තය රු.47,000,000 කින් අධිගණනය වී තිබුණි.

(iii) ඉඩම වෙනුවෙන් දරන ලද එකතු කළ අගය මත බදු වටිනාකම රු. 2,698,675 ක් වුවද බලශක්ති අරමුදලට රු. 5,020,368 ක් හර කිරීම හේතුවෙන් එම අරමුදල් ගිණුමේ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. 2,321,693 කින් ඌන ගණනය වී තිබුණි.

(iv) 2015 හා 2016 වර්ෂවලදී එම ගොඩනැගිල්ල සැලසුම් කිරීම වෙනුවෙන් වියදම් දැරීම සඳහා රු.3,936,978 ක් බලශක්ති අරමුදල් ආයෝජන ගිණුමෙන් ඉවත්කර තිබුණද එය අරමුදල් ගිණුමට හර නොකිරීම හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට අරමුදල් ගිණුමේ ශේෂය එම වටිනාකමින්ම අධිගණනය වී තිබුණි.

(v) බලශක්ති අරමුදලින් රු. 47,000,000 ක් ඉවත් කර තිබුණද ඉඩම වෙනුවෙන් දරන ලද මුළු වියදම රු. 45,856,451 ක් වුයෙන් වැඩිපුර ඉවත් කරන ලද රු.1,143,549 අරමුදලට ආපසු ගෙවිය යුතු ශේෂයක් ලෙස ගිණුම් ගත කර නොතිබුණි.

(ආ) හම්බන්තොට සූර්ය බල උද්‍යානය සඳහා 2011 ජූලි 28 දින මහවැලි අධිකාරියෙන් අත්පත් කරගෙන තිබුණු අක්කර 50 ක ඉඩම සමාලෝචිත වර්ෂයේ දී ද තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ භාණ්ඩාගාරයෙන් රාජ්‍ය ප්‍රදාන ලෙස ලැබී තිබුණු රු.60,000,000 ක මුදලින් වැඩසටහන් වියදම් සඳහා රු.42,144,744 ක් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ ආදායම් ලෙස හඳුනාගත යුතු වුවද රු.41,247,949 ක් පමණක් ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඈ) නොපැවරුණු ආසියානු සංවර්ධන බැංකු ණය යටතේ ක්‍රියාත්මක තිරසාර බලශක්ති අංශය අදියර 2 ව්‍යාපෘතිය හා පිවිතුරු බලශක්තිය සහ ජාල කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ නිකුත් කරන ලද රු.62,560,065 ක් වූ ණය, ගෙවීමේ වගකීම අධිකාරියට පවරා නොතිබියදී අධිකාරිය විසින් ජංගම නොවන බැරකම් යටතේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දක්වා තිබුණි.

## 2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

-----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට බලශක්ති අරමුදලේ ශේෂය රු.293,257,237 ක් වූ අතර එදිනට ආයෝජන ශේෂය රු.306,628,315 ක් වුයෙන් රු.13,371,078 ක වෙනස සංසන්දනය කර නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) භාණ්ඩාගාර බිල්පත් හා ස්ථාවර තැන්පතු පොලී ආදායම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු. 1,231,353 ක් ඇප අරමුදලට බැර කළ යුතු වුවත් රු. 1,136,900 ක් බැර කර තිබීම හේතුවෙන් රු. 94,453 ක වෙනසක් නිරීක්ෂණය විය.

## 2.4 අසම්භාව්‍ය බැරකම්

------------------------

2008 මාර්තු 21 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ලංකා විදුලි බල මණ්ඩලය සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති සංවර්ධනකරුවන් සඳහා නව ගාස්තු ක්‍රමය ක්‍රියාත්මක කර තිබුණි. ඒ අනුව “ Cost based tariff ” ක්‍රමය යටතේ පිරිවැයෙන් සියයට 90 ක් ලංකා විදුලි බල මණ්ඩලය දැරීමටත් ඉතිරි සියයට 10 සුනිත්‍ය බලශක්ති අධිකාරියෙන් ප්‍රතිපූරණය කිරීමටත් තීරණය කර තිබුණි. මෙම තීරණය මත 2010 දෙසැම්බර් 31 දිනට සුනිත්‍ය බලශක්ති අධිකාරියෙන් ලංකා විදුලිබල මණ්ඩලයට ගෙවිය යුතු රු. 897,025,999 ක මුදල මූල්‍ය ප්‍රකාශනවල අසම්භාව්‍ය බැරකම් යටතේ හෙළිදරව් කර තිබුණද එම මුදල පියවීමට කිසිදු වැඩපිළිවෙලක් අධිකාරිය විසින් සකස් කර නොතිබුණි.

## 2.5 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) Regional Centre for Lighting මධ්‍යස්ථානය වෙනුවෙන් විදුලිබල මණ්ඩලයෙන් අයවිය යුතු රු.8,033,270 ක මුදල 2017 සැප්තැම්බර් 27 දින දක්වාම අයකරගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට, ලැබිය යුතු ගිණුම්වල ඇතුළත් වර්ෂයට වැඩි සහ වර්ෂ 4 ට අඩු කාලපරිච්ඡේදයට අදාලව ලැබිය යුතු රු. 565,688 ක ශේෂය හා බාහිර පාර්ශවයන් වෙත ලබා දුන් රු. 3,480,844 ක අත්තිකාරම් සහ සමාලෝචිත වර්ෂය තුළ අධිකාරියේ ප්‍රධාන ක්‍රියාකාරී ව්‍යාපෘති 4 වෙනුවෙන් ලබා දුන් රු.16,397,978 ක අත්තිකාරම් මුදල්ද 2016 දෙසැම්බර් 31 දින දක්වාම පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට උපචිත වියදම් ලෙස ගිණුම්වල දක්වා තිබූ රු. 11,645,917 ක් අතරින් රු. 7,269,482 ක් වර්ෂ 05 ට වැඩි කාලයක සිට ද රු. 352,704 ක් වර්ෂ 04 ක කාලයක සිටද, ඉදිරියට ගෙන එමින් පැවතුණු අතර මෙම මුදල නිරවුල් කිරීමට හෝ ඒ සඳහා වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට අධිකාරිය සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කටයුතු කර නොතිබුණි.

## 2.6 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

"ස්විච් - ඒෂියා"වැඩ සටහන යටතේ යුරෝපා සංගමයෙන් ලැබී තිබුණු රු. 7,334,354 ක මුදලින් රු. 3,135,202 ක්, 1994 ජුනි 04 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව 2010 හා 2011 වර්ෂයන්හි දී අධිකාරියේ සියලු නිලධාරීන් සඳහා වෘත්තීය දීමනා ලෙස ගෙවා තිබුණි. නීත්‍යානුකූල නොවන මෙම ගෙවීම අදාල නිලධාරීන්ගෙන් හෝ ඊට වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකිරීමට අමාත්‍යාංශයේ ලේකම් විසින් 2012 දෙසැම්බර් 03 දින දෙන ලද නියෝගය 2017 සැප්තැම්බර් 30 දක්වාම ඉටු කර ගෙන නොතිබුණි.

## 2.7 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

විගණනයේ දී නිරීක්ෂණය වූ අනුකූල නොවීමේ අවස්ථා පහත දැක්වේ.

| නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
| --- | --- |
| **(අ) 2007 අංක 35 දරන සුනිත්‍ය බලශක්ති අධිකාරී පනත**<br>46 (3) වගන්තිය | බලශක්ති අරමුදලෙහි අරමුණට පටහැනිව සුනිත්‍ය බලශක්ති අධිකාරියට කාර්යාල ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා ඉඩමක් මිලදී ගැනීමට හා එම ගොඩනැගිල්ලෙහි සැලසුම් සකස් කිරීම සඳහා 2015 හා 2016 යන වර්ෂ වලදී එකතුව රු.50,936,978 ක් අධිකාරිය විසින් එම අරමුදලේ ආයෝජන වලින් ඉවත්කර ගෙන තිබුණි. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය**<br>II පරිච්ඡේදයේ 13.7 වගන්තිය හා VII පරිච්ඡේදයේ 12.2.6 වගන්තිය | පත්කිරීමේ බලධාරියා විසින් නිසි පරිදි පත්වීම් සිදුකර නොතිබියදී හා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියකින් තොරව 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වැඩබැලීමේ දීමනා ලෙස එකතුව රු.2,180,886 ක් ගෙවා තිබුණි. |

| | | |
|---|---|---|
| **(ඇ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| | මුදල් රෙගුලාසි 756 | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අධිකාරියේ වත්කම් සම්බන්ධයෙන් භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |
| (ඈ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන චක්‍රලේඛය | එකතුව රු.1,869,975,742 ක් වූ වත්කම් සඳහා වූ ස්ථාවර වත්කම් ලේඛනයක් චක්‍රලේඛය ප්‍රකාරව පවත්වා නොතිබුණි. |
| (ඉ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන චක්‍රලේඛය | වටිනාකම රු.14,885,933 ක් වූ පරිගණක, උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ඊ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/ 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සමඟ 2016 වර්ෂය සඳහා වූ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (උ) | 2008 ජූලි 28 දිනැති අංක පීඊඩී/50 හා 2015 මැයි 22 දිනැති අංක පීඊඩී 2015/01 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව හා චක්‍රලේඛවලට පටහැනි ලෙස ඉහළ තනතුරුවල වැඩබැලීම් සිදුකරන නිලධාරීන් 06 දෙනෙකු වෙත 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා ඉන්ධන දීමනා ලෙස රු.2,600,000 ක් හා 2015 හා 2016 වර්ෂය තුල අංශ ප්‍රධානීන් තනතුරු 03 ක් වෙනුවෙන් ප්‍රවාහන දීමනා ලෙස රු.1,650,000 ක් ගෙවීම් කර තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

---------------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලය රු.6,463,693 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 52,410,929 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.45,947,236 ක අඩුවීමක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයේදී ප්‍රාග්ධන ලැබීම් ලෙස ලැබුණු රු.47,000,000 ක් අයභාර ලැබීම් ලෙස හඳුනාගැනීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේ දී අඛණ්ඩව අතිරික්තයන් ලබා තිබුණ ද 2012 සහ 2013 වර්ෂයන් අතර එය සියයට 71 කින් වර්ධනය වී තිබුණි. ඒ අනුව සේවක පාරිශ්‍රමික, රජයට ගෙවූ බදු හා ක්ෂය සැලකීමෙන් පසු අධිකාරියේ දායකත්වයේ සියයට 15 ක වැඩි වීමක් ද දක්නට ලැබුණි. කෙසේ වුව ද 2014 වර්ෂය තුල 2013 ට සාපේක්ෂව සියයට 5ක දායකත්වයේ අඩු වීමක් නිරීක්ෂණය වූ අතර 2015 දී එය 2014 ට සාපේක්ෂව සියයට 17 කින් වැඩිවී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

----------------------------------

### 4.1 කාර්යසාධනය

----------------

2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරි පනතට අනුව අධිකාරියේ ප්‍රධාන පරමාර්ථ පහත සඳහන් කරනු ලැබේ.

(i) බලශක්ති සුරක්ෂිතභාවය වැඩිදියුණු කිරීමේ අරමුණින් නැවත බලගැන්විය හැකි බලශක්ති සම්පත් හඳුනාගැනීම, තක්සේරු කිරීම හා සංවර්ධනය කිරීම,

(ii) ගෘහස්ත, වාණිජමය, කෘෂිකාර්මික, ප්‍රවාහන, කාර්මික සහ වෙනත් යම් අදාල අංශයක භාවිතය සඳහා බලශක්තිය භාවිත කිරීම පිළිබඳ බලශක්ති කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීම සහ බලශක්ති සංරක්ෂණ වැඩසටහන් හඳුනා ගැනීම සහ කළමනාකරණය කිරීම, සහ

(iii) ප්‍රතිපත්ති වැඩිදියුණු කිරීමෙන් බලශක්තිය බෙදාහැරීම පිළිබඳ සුරක්ෂිතභාවය, විශ්වාසනීයත්වය සහ පිරිවැය සඵලදායිතාවය ප්‍රවර්ධනය කිරීම සහ අවම ආර්ථික පිරිවැයට ස්වකීය පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් අරමුදල් පවතින බව තහවුරු කිරීම.
ඉහත පරමාර්ථ ඉටුකරගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) බලශක්ති විගණනය**

-------------------------

ලංකාවේ බලශක්ති සේවා සපයන එකම රාජ්‍ය ආයතනය වශයෙන් සුනිත්‍ය බලශක්ති අධිකාරියට බලශක්ති කාර්යක්ෂමතා සේවා සැපයීම (Energy Auditing and Energy efficiency improvement) සම්බන්ධයෙන් සෘජු වගකීමක් ඇති බැවින් අධිකාරිය සතුව ඉංජිනේරුවන් හා තාක්ෂණ නිලධාරීන් ඇතුළු ප්‍රවීන කාර්ය මණ්ඩලයක් හා සංකීර්ණ මැනුම් උපකරණ තිබිය යුතු වුවත් මෙම බලශක්ති සේවා අංශයේ සේවයේ නියුතු කාර්ය මණ්ඩලය සමාලෝචිත වර්ෂයේ දී එක් තාක්ෂණ නිළධාරියකු දක්වා අඩු වීම හා 2008 හා 2010 වර්ෂවල මිලටගෙන තිබුණු මැනුම් උපකරණ භාවිතා කිරීම හේතුවෙන් සේවා සැපයීම පහත වැටී තිබුණි.

(ආ) නාගරික සංවර්ධන අධිකාරියට අයත් මීතොටමුල්ලෙහි අක්කර 3.5 ක ඉඩමක ඝන අපද්‍රව්‍ය මඟින් මෙගා වොට් 10 ක විදුලි උත්පාදන ව්‍යාපෘතියක් සඳහා Western Power පුද්ගලික සමාගමක් වෙත 2014 මැයි 23 දින බලපත්‍ර (EP – 325530) නිකුත් කර තිබුණ ද එම බලපත්‍රය වසර 02 ක වලංගු කාලය අවසානයේ දී එනම් 2016 මැයි 22 වන විටද අදාල ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි.ඝන අපද්‍රව්‍ය අපහරණය කිරීමේ ගැටලුවට පිළියමක් ලෙස මෙවැනි ව්‍යාපෘතීන් කඩිනමින් ක්‍රියාත්මක කළ යුතු වුවත් බලපත්‍ර නිකුත් කිරීමෙන් පසුව අධිකාරිය විසින් ප්‍රමාණවත් පරිදි අධීක්ෂණය කර නොමැති බව නිරීක්ෂණය විය.

ආයතනයට හෝ ව්‍යාපෘති යෝජකයාට පාලනය කිරීමට නොහැකි සාධක වූ බලාගාර ඉදිකිරීමට යෝජිත ඉඩම් ලබා ගැනීමේදී පදිංචිකරුවන්ගේ විරෝධය වැනි තත්ත්වයන් විසඳෙන තුරු සාධනීය ප්‍රගතියක් අපේක්ෂා කල නොහැකි බව සභාපතිවරයා විසින් මා වෙත දන්වා තිබුණි.

(ඇ) 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනතේ 21.1 වගන්තිය අනුව සූර්ය බල උත්පාදන පද්ධති ආනයනය කර සවිකිරීම් සිදුකරන සමාගම් වෙත බලපත්‍ර ලබාදීම හා ඒවා ගුණාත්මක හා විශ්වාසනීය තත්ත්වයෙන් ක්‍රියාත්මක වන්නේද යන්න පරීක්ෂා කිරීම ආයතනයේ කාර්යයක් වුවද, බලපත්‍රලාභී සමාගම් විසින් ආනයනය කර සවිකරන ලද සූර්යබල උත්පාදන පද්ධතිවල ගුණත්වය හා සේවා සැපයීම් පිළිබඳ ප්‍රමාණවත් පරීක්ෂාවක් සිදුකර නොතිබුණි.

(ඈ) සුළං මාපක කුළුණු 10 ක් ඉදිකිරීම සඳහා පුද්ගලික සමාගමක් සමඟ 2008 ජූලි 14 දින ගිවිසුමකට එළඹ තිබුණු අතර එම ඉදි කිරීම් වසරක් තුළ අවසන් කළ යුතුව තිබුණි. එසේ වුවද 2012 වර්ෂය වනවිට ඉදිකිරීම අවසන් කර තිබූ සුළංමාපක කුළුණු 09 හි දත්ත එකතු කිරීමේදී කුළුණු වල උපකරණ ක්‍රියාවිරහිත වීම නිසා හා දත්ත එකතු කර ගැනීමට අදාල ස්ථානයන් වෙත නොයෑම හේතුවෙන් ඇතැම් කුළුණුවල අඛණ්ඩව දත්ත ලබාගෙන නොතිබුණි. තව ද මෙම දත්ත උපයෝගී කර සුළං බල සම්පත් සිතියම් හා සැළසුම් සකස් කිරීම අවසාන කර නොතිබුණි.

(ඉ) 2011 වර්ෂයේදී වැඩපුර්ව අත්තිකාරම් ලෙස රු.416,875 ක් ගෙවීම්කර උපකරණ පිරිවැය හා පිරිසැකසුම් ගාස්තු ලෙස එකතුව රු.1,410,250 ක් වැයකර තිබුණු එක් සුළං මාපක කුළුනක ඉදිකිරීම් අතරමග නතර කර තිබුණු අතර 2017 සැප්තැම්බර් 30 දින වනවිටත් එම ඉදිකිරීම අවසන් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. වසර හයකට පෙර මිලදීගත් උපකරණ තවදුරටත් භාවිතා කිරීම හා පිරිසැකසුම් ගාස්තු ආපසු අයකර ගැනීම පිළිබඳ විගණනයේදී ගැටළුකාරි විය.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය සඳහා ප්‍රධාන කාර්යාලයක් ඉදිකිරීම වෙනුවෙන් වසර 30 ක කල්බදු පදනම යටතේ 2015 ජුනි 22 දින රු.45,856,451 ක් වැයකර නාගරික සංවර්ධන අධිකාරියෙන් ඉඩමක් ලබාගෙන තිබුණි. නීතිමය උපදෙස් ලබාගැනීමකින් තොරව බදු ගිවිසුමකට එළඹ තිබීම හේතුවෙන් වසර 2 ක් තුල සංවර්ධන කටයුතු නිමකිරීමට අපොහොසත් වුවහොත් බදු දේපලේ අයිතිය බදුකරුට ලැබෙන බවට කොන්දේසියක් ඇතුළත්ව තිබුණි. එහෙත් 2017 සැප්තැම්බර් 30 දින වනවිට වසර 2 ක් ඉක්ම ගොස් තිබුණද ගොඩනැගිල්ලේ සැලසුම් නිර්මාණ කටයුතු අවසන් කර නොතිබුණි.

(ආ) 2016 දෙසැම්බර් 25 දින විශ්‍රාම ලැබූ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවෙකුට පාරිතෝෂික මුදල් වශයෙන් රු.782,260 ක් ගෙවා තිබූ අතර ඒ සඳහා 2016 අප්‍රේල් 25 දිනැති අංක 02/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයෙන් බැහැරව ගැලපුම් දීමනාවද එකතු කර ගණනය කර තිබූ බැවින් රු. 94,990 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඇ) සුනිත්‍ය බලශක්ති අධිකාරියේ ආරම්භයේ සිට සේවක වැටුප් පරිවර්තනය කිරීමේ දී සිදු වූ දෝෂ සම්බන්ධයෙන් ආයතනය විසින් සිදුකරන ලද විමර්ශන වාර්තාව 2012 පෙබරවාරි 03 දින අධිකාරිය වෙත ඉදිරිපත් කර තිබුණ ද එහි සඳහන් නිර්දේශ ආයතනය විසින් මේ දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි. එම වාර්තාවට අනුව 2007 ඔක්තෝබර් 01 දින සිට 2011 සැප්තැම්බර් 30 දින දක්වා චක්‍රලේඛ වලින් බැහැරව වැඩිපුර ගෙවන ලද රු.2,171,760 ක වැටුප් හා දීමනා අදාල නිලධාරීන්ගෙන් අය කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිළධාරි ලෙස අමාත්‍යාංශ ලේකම් විසින් නියෝග කර තිබුණද, ඒ සම්බන්ධයෙන් අධිකාරිය කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඇ) ප්‍රොටොටයිප් විදුලි වාහන තුනක් සංවර්ධනය කිරීම

2007 සැප්තැම්බර් 28 දින ඇති කර ගන්නා ලද ගිවිසුමකට අනුව මාස 18 ක් ඇතුළත ප්‍රොටොටයිප් විදුලි වාහන තුනක් සංවර්ධනය කිරීම සඳහා 2007 වර්ෂයේ දී බාහිර පාර්ශවයකට රු. 7,956,800 ක් ගෙවා තිබුණි. කෙසේ වුවද, 2017 සැප්තැම්බර් 30 දින දක්වාම එක් වාහනයක් හෝ සංවර්ධනය කිරීමට සංවර්ධක ආයතනයට නොහැකි වී තිබූ අතර වර්ෂ 8 ක් ගත වී තිබුණද , වාහන 03 ක් සංවර්ධනය කරවා ගැනීමට හෝ ගෙවන ලද මුදල ආපසු අයකර ගැනීම සඳහා නීත්‍යානුකූල වශයෙන් අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.

## 4.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) "ස්විච් - ඒෂියා" වැඩ සටහන යටතේ ලැබී ඉතිරිව තිබූ රු. 4,548,176 ක්, 2011 වර්ෂයේ සිට මහජන බැංකුවේ ජංගම ගිණුමක ද, බලශක්ති අරමුදලට අදාල රු. 150,000,000 ක ට වැඩි මුදලක් වසර ගණනාවක සිට රාජ්‍ය බැංකුවක ඉතිරි කිරීමේ ගිණුමක ද කිසිදු ආයෝජන කටයුත්තක් සඳහා යොදවා ගැනීමකින් තොරව තැන්පත් කර තිබුණි.

(ආ) අධිකාරිය සතු කැබ්රථයක් වසර 2½ ක පමණ කාලයක සිට නිෂ්ක්‍රීයව පවතින අතර මෙම වාහනය අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට 2017 සැප්තැම්බර් 30 දින දක්වාම අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති අංක 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.3 ඡේදය ප්‍රකාරව අධිකාරිය සඳහා අනුමත බඳවා ගැනීමේ පරිපාටියක් සකස්කර අනුමත කරගෙන නොතිබුණි.

(ආ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අධිකාරිය සඳහා අනුමත කරන ලද කාර්ය මණ්ඩලය 136 ක් වූ අතර 2016 දෙසැම්බර් 31 දිනට සත්‍ය කාර්ය මණ්ඩලය 103 ක් විය. ඒ අනුව අධ්‍යක්ෂ තනතුරු 3ක්, අංශ ප්‍රධාන තනතුරු 4 ක් හා කළමනාකරණ තනතුරු 12 ක් ඇතුළුව කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 33 ක් පැවතුණි.

2007 වර්ෂයේ සිට මේ දක්වා අනුමත තනතුරු සංඛ්‍යාව යොදා ගනිමින් හා ඒ තුල සුළු සංශෝධනයන් සිදු කරමින් සංශෝධිත සංවිධාන ව්‍යුහයක් සකස් කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියට යොමු කිරීම සඳහා විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය වෙත යොමු කර ඇති බව සභාපතිවරයා විසින් දන්වා තිබුණි.

(ඇ) ඉහත පරිදි පුරප්පාඩු වූ අධ්‍යක්ෂවරුන් තිදෙනා සහ අංශ ප්‍රධානීන් 4 න් 3 දෙනෙකු සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II වන පරිච්ඡේදයේ 13.1(ආ) ඡේදයේ නියමයන්ගෙන් බැහැරව නිත්‍ය තනතුරේ පත්කිරීම් බලධාරියා වන අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියකින් තොරව අධිකාරියේ සභාපතිවරයා විසින් වැඩ බැලීමේ තනතුර සඳහා පත් කිරීම් සිදු කර තිබුණි.

**4.5 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් සම්පත්**

---

අංශ ප්‍රධානී (තාක්ෂණික ප්‍රවර්ධන) සහ වැඩබලන අධ්‍යක්ෂ (ක්‍රමෝපාය) තනතුරු දරන නිලධාරියා 2016 පෙබරවාරි 15 දින විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (තාක්ෂණ) තනතුරට 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙන් බැහැරව අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව වසරක කාලයක් සඳහා පූර්ණ කාලීනව නිදහස්කර විගණන දිනය වූ 2017 මැයි දක්වා ඔහුට අධිකාරිය විසින් රු.1,404,828 ක වැටුප් ගෙවා තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

---

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

---

2007 ඔක්තෝබර් 02 දිනැති අංක පීඊඩී/45 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3 වගන්තිය ප්‍රකාර ගිණුම් ඉදිරිපත් කිරීමේ කළමනාකරණයේ වගකීම පිළිබඳ ප්‍රකාශය මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි.

**5.2 සංයුක්ත සැලැස්ම**

---

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 ඡේදය ප්‍රකාරව සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**5.3 ක්‍රියාකාරී සැලැස්ම**

---

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව ව්‍යාපෘති, වැඩසටහන් හා ක්‍රියාකාරකම් සඳහා සමාලෝචිත වර්ෂයේ දී වෙන්කර තිබූ රු. 280,421,124 ක මුදලින් රු. 111,236,670 ක් හෙවත් සියයට 40 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ක්‍රියාකාරි සැලැස්මේ ක්‍රියාකාරකම් කාර්යක්ෂමව සිදුකර අපේක්ෂිත අරමුණු ප්‍රමාණවත් පරිදි ඉටු කර ගැනීමට අධිකාරිය අපොහොසත්වී තිබුණි .

**5.4 අභ්‍යන්තර විගණනය**

---

සමාලෝචිත වර්ෂයේ දී ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයෙකු නොමැති වීම හේතුවෙන් විගණන සැලැස්මට අනුව ප්‍රමාණවත් විගණනයක් සිදු කර නොතිබුණි.

**5.5 අයවැය ලේඛනමය පාලනය**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අයවැය මඟින් ප්‍රාග්ධන වියදම් සඳහා රු. 6,000,000 ක් ප්‍රතිපාදන වෙන්කර තිබුණු අතර ඉන් රු. 2,549,041 ක් පමණක් වැය කර තිබුණි. ඒ අනුව ප්‍රාග්ධන වෙන්කිරීම් වලින් රු.3,450,959 ක් එනම් සියයට 58 ක් අදාල කාර්යයන් සඳහා උපයෝජනය කර නොතිබුණි. අයවැය මඟින් ප්‍රතිපාදන වෙන්කර නොතිබුණ ද, එම ඉතිරි ප්‍රතිපාදනද උපයෝගීකර ගොඩනැඟිලි හා ඉඩම් වැඩිදියුණු කිරීම සඳහා රු. 4,238,165 ක වියදමක් දරා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් සම්බන්ධයෙන් අයවැයගත වියදම තථ්‍ය වියදම සමඟ සැසඳීමේ දී වියදම් අයිතම 9 කට අදාළව සියයට 17 සිට සියයට 161 දක්වා සැළකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින් වර අධිකාරියේ සභාපතිවරයා දැනුවත් කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුවේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) ගිණුම්කරණ ප්‍රමිත අනුගමනය නොකිරීම් , අත්හැරීම්, නොසැසඳීම් පැවැතීම<br>(ii) විවිධ වැය ශීර්ෂ යටතේ දරන ලද වියදම් විශ්ලේෂණය කිරීමට හැකිවන පරිදි පරිගණකගත ලෙජරයන් හඳුන්වා නොදීම |
| (ආ) | මූල්‍ය පාලනය | නිශ්ක්‍රීය මුදල් ශේෂයන් පැවතීම. |
| (ඇ) | ණයගැති පාලනය | ණයගැතියන් හා වෙනත් ලැබිය යුතු මුදල් අප්‍රමාදව එකතුකර නොගැනීම. |
| (ඈ) | මානව සම්පත් කළමනාකරණය | අධිකාරියේ අරමුණු ඉටුකර ගැනීම සඳහා වූ කාර්යභාරය හා ප්‍රමාණය අනුව මානව සම්පත් කාර්යක්ෂමව කළමනාකරණය කර නොගැනීම. |
| (ඉ) | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම | ව්‍යාපෘති වලින් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම සඳහා ව්‍යාපෘති කාර්යයන් සැලසුම් කළ පරිදි කාර්යක්ෂමව හා අප්‍රමාදව ක්‍රියාත්මක නොකිරීම. |
| (ඊ) | අයවැය පාලනය | තාත්විකව සකස්කර මූල්‍ය පාලන කාරකයක් ලෙස උපයෝගී කර නොගැනීම. |
| (උ) | වත්කම් කළමනාකරණය | (i) දේපල, පිරියත හා උපකරණ අගය කිරීම, ලේඛන ගත කිරීම, ක්‍රමානුකූලව සිදු නොවීම හා ඒවා අධිකාරියේ අරමුණු ඉටුකර ගැනීම සඳහා කාර්යක්ෂමව උපයෝජනය නොකිරීම.<br>(ii) පැරණි මැනුම් උපකරණ අළුත් කිරීමට හෝ භාවිතා කිරීම නොහැකි තත්ත්වයේ ඒවා අපහරණය කිරීමට කටයුතු නොකිරීම. |